# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2048/45 – 2017 දෙසැම්බර් 08 වැනි සිකුරාදා – 2017.12.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරළේ සුළු කොට්ඨාසයේ, වැලිව (අ.ග.පි. 10) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/පීටීබී/2017/07 හා 2017.02.20 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – මොරවක වත්ත – ප්‍රමාණය: හෙක්. 2.0234**

උතුරට: ධර්මසිරි විදාන පතිරන සහ තවත් අය හිමිකම් කියන විතානගේ කුඹුර, මාර්ගය සහ වික්‍රම රදාගේ පද්මා සහ තවත් අය හිමිකම් කියන අඹගහවත්ත; නැගෙනහිරට: වික්‍රම රදාගේ පද්මා සහ තවත් අය හිමිකම් කියන අඹගහවත්ත, සුමේධ කුලතුංග හිමිකම් කියන මොරවක වත්ත සහ මාර්ගය; දකුණට: සුමේධ කුලතුංග හිමිකම් කියන මොරවක වත්ත සහ මාර්ගය; බටහිරට: සුමේධ කුලතුංග හිමිකම් කියන මොරවක වත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2016/පීසී/432.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: පීටීබී/ එල්එන්ඩී/ සීකිව්ඒයි/ 07/038.
2017 අගෝස්තු මස 22 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

12 - 789